සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

6 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි.

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I - කොටස

- අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 සිදුහත් කුමරුගේ මව් වූයේ,

(i) යශෝධරා දේවියයි. (ii) මහමායා දේවියයි.

(iii) මහා ප්‍රජාපතී ගෝතමී දේවියයි. (iv) කිසා ගෝතමී දේවියයි.

02 මහාභිනිෂ්ක්‍රමණය සිදු වූයේ,

(i) උඳුවප් පොහෝ දිනක ය. (ii) වෙසක් පොහෝ දිනක ය.

(iii) පොසොන් පොහෝ දිනක ය. (iv) ඇසළ පොහෝ දිනක ය.

03 බුදු දහමෙහි මහා බ්‍රහ්මයාගේ තත්ත්වය පිරිනමා ඇත්තේ,

(i) ගුරුවරුන්ට ය. (ii) දෙමාපියන්ට ය. (iii) සීලවන්තයින්ට ය. (iv) පාලකයින්ට ය.

04 ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය වන්නේ,

(i) නා මල ය. (ii) නෙළුම් මල ය. (iii) මානෙල් මල ය. (iv) ඇට්ටේරියා මල ය.

05 අනුන්ගේ සැපත , ජයග්‍රහණය දක ඊර්ෂ්‍යා නොකර සතුටු වීම,

(i) මෙත්තා ය. (ii) කරුණා ය. (iii) මුදිතා ය. (iv) උපේක්ෂා ය.

- **අංක 06 සිට 10 තෙක් ප්‍රශ්නවල (අ) කොටසේ වචන හා සම්බන්ධ (ආ) කොටසේ වචන තෝරා ඉරකින් යා කරන්න.**

| (අ) | | (ආ) |
|---|---|---|
| 06 | දෙව්දහ නුවර | (i) සුජාතා සිටු දේවිය |
| 07 | කුස තණ මිටි අට | (ii) සොත්ථිය බමුණා |
| 08 | අම්බලට්ඨිකා ආවාසය | (iii) රාහුල හාමුදුරුවෝ |
| 09 | රජගහ නුවර | (iv) මහාමායා දේවිය |
| 10 | කිරිපිඬු දානය | (v) බිම්බිසාර රජතුමා |

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල දැක්වෙන වගන්ති හරි නම් (✓ )ලකුණ ද වැරදි නම් (× ) ලකුණ ද ඉදිරියෙහි ඇති වරහන තුළ යොදන්න.**

11 බෝසත් කුමරුගේ නම් තැබීමේ මංගල්‍යයට කැඳවූ බමුණු පඬිවරුන් ගණන අටකි. (    )

12 සුද්දෝධන රජු තම පුතුට දෙවන වැඳීම කළේ වප් මඟුල් උළෙල අවස්ථාවේදී ය. (    )

13 සිදුහත් තවුසාණන් මුලින් ම ධර්මය හැදෑරීම සඳහා ගියේ ආලාරකාලාම තවුසා වෙත ය. (    )

14 මාතෘ භූමියෙහි සෞන්දර්ය හා සෞභාග්‍යය ජාතික ගීතයෙන් පවසයි. (    )

15 වැරදි නොකොට ඉන් වැළැකීමෙන් පමණක් ම සිල්වතකු බවට පත්විය හැකිය. (    )

- **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.**

16 සිදුහත් කුමරුගේ සන්සුන් බව දැක නිබ්බුත පද කීවේ..........................................................දේවියයි. ( යශෝධරා / සුජාතා / කිසා ගෝතමී )

17 බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමට පෙර දින සිහින.......................................................දුටු සේක. ( පහක් / හතක් / දාසයක් )

18 සත්ත්වයාගේ උප්පත්තිය හා මරණය සිදුවන ආකාරය දැකීමේ නුවණ..................................................ඥාණය නම් වේ. ( පුබ්බේනිවාසානුස්සති / චුතූපපාත / ආසවක්ඛය )

19 "ආනන්ද සර්පයා දුටුවා ද?" යනුවෙන් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ ..................................................... දැකීමෙනි. ( නයෙක් / මුදල් පසුම්බියක් / චණ්ඩ මිනිසෙකු )

20 බුදුරජාණන් වහන්සේ අම්බලට්ඨිකා රාහුලෝවාදය සූත්‍රයේදී හොඳ නරක පැහැදිලි කිරීමට උදාහරණයට ගත්තේ..........................................................ය. ( කලයක් / කැඩපතක් / මුදල් )

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01 කෙටි පිළිතුරු සපයන්න.

(i) සිදුහත් කුමරු ඒකාන්තයෙන් ම බුදුවන බව ප්‍රකාශ කළ දෙදෙනා කවුරුන් ද?

(ii) සිදුහත් කුමරු දුටු සතර පෙර නිමිති මොනවා ද?

(iii) " මනසා සංවරෝ සාධු " යන්නෙහි තේරුම ලියන්න.

(iv) ශ්‍රී ලංකාවේ වෙසෙන දෙමළ , මුස්ලිම් , බර්ගර් , මැලේ ඇතුළු අනිකුත් ජාතීන් නියෝජනය කිරීම සඳහා ජාතික කොඩියේ යොදා ඇති තීරු දෙකෙහි පාට මොනවා ද?

(v) සීලය යනු කුමක් ද?

(vi) ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය නා ගස වේ. නා ගස සෙවණේ බුදු බව ලබාගත් බුදුරජාණන් වහන්සේලා දෙදෙනකු නම් කරන්න.

(vii) වචනයෙන් සිදුවන අකුසල් දෙකක් ලියන්න.

(viii) බුදු දහමට අනුව නිවන ලබා ගැනීමට අත්හල යුතු අන්ත දෙක මොනවා ද?

(ix) රාහුල හාමුදුරුවන්ගේ චරිතයෙන් අපට ලබාගත හැකි ආදර්ශ දෙකක් ලියන්න.

(x) පහත දැක්වෙන කවියෙහි ඉතිරි පද ලියන්න.

බොරු බස් කියා කිසිවෙකු නොරවටන්නෙමි
කෙනෙකුන් ලවා බොරුවක් නොකියවන්නෙමි
............................................................
............................................................

(ලකුණු 2 x 10 = 20)

02 (i) සීලය හා සම්බන්ධ පහත වචන වල තේරුම ලියන්න.

(අ) විරමනය (ආ) සමාදානය

(ii) පන්සිල් සුරැකීමේදී සෑම සිල් පදයක් ම අංශ තුනකින් ආරක්ෂා කළ යුතුය. එම අංශ තුන මොනවා ද?

(iii) පංච සීලය යනු පස්පව් වලින් වැලකී සිටීම ය. එම පස්පව් මොනවා ද?

(ල. 2 + 3 + 5 = 10)

03 (i) සිව් බඹ විහරණයන් ලියන්න.

(ii) " මගෙ අම්මා මට හිත කැමතියි " යන කවිය සම්පූර්ණ කර ලියන්න.

(iii) දෙමව්පියන් විසින් දරුවන්ට කරුණු පහකින් සංග්‍රහ කරනු ලබයි. ඒවා ලියා දක්වන්න.

(ල. 2 + 3 + 5 = 10)

04 (i) සසර දුක් සහිත ය. උපතක් සමග ම ඇතිවන කටුක අත්දැකීම් දෙකක් ලියන්න.

(ii) සම්මා කම්මන්තයට අයත් අංග තුන ලියන්න.

(iii) සිල්වත්ව කටයුතු කිරීමේ ආනිශංස පහක් ලියන්න. (ල. 2 + 3 + 5 = 10)

05 (i) 'වෙනස්වීම' බුදු දහමේ හඳුන්වන්නේ කුමන නමකින් ද?

(ii) වෙනස්වීම නිසා ඕනෑම සත්වයකු අවධි කිහිපයක් පසු කරයි. එම අවධි තුනක් නම් කරන්න.

(iii) "ලෝකයේ පණ ඇති හා පණ නැති සියල්ල සෑම මොහොතකම වෙනස් වේ." මෙම කියමන සනාථ කෙරෙන ඔබ ජීවත්වන පරිසරයේ දකින මෙවැනි සිදුවීම් පහක් ලියන්න.

(ල. 2 + 3 + 5 = 10)

06 (i) සිත , කය , වචනය යන තිදොරින් සිතාමතා කරනු ලබන ක්‍රියා , කුසල කර්ම හා අකුසල කර්ම වේ.

(අ) කුසල කර්මයක් යනු කුමක් ද?

(ආ) අකුසල කර්මයක් යනු කුමක් ද?

(ii) (අ) බුදුහාමුදුරුවන්ගේ කාලයේ සිටි සුමන නම් මල්කරුවා කළ හොඳ ක්‍රියාව කුමක් ද?

(ආ) එම ක්‍රියාව කළ අවස්ථාවේ සිදුවූ අසිරිමත් සිදුවීම කුමක් ද?

(ඉ) එම ක්‍රියාවට රජතුමාගෙන් ඔහුට ලැබුණේ මොනවා ද?

(iii) ඔබ විසින් කරන ලද යහපත් ක්‍රියා පහක් ලියන්න. (ල. 2 + 3 + 5 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) ii　(02) iv　(03) ii　(04) iii　(05) iii　(06) iv　(07) ii　(08) iii
(09) v　(10) i　(11) ✗　(12) ✓　(13) ✗　(14) ✓　(15) ✗　(16) කිසාගෝතමී
(17) පහක්　(18) චුතූපපාත　(19) මුදල් පසුම්බියක්　(20) කැඩපතක්

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

01 (i) අසිත / කාලදේවල තවුසා , කොණ්ඩඤ්ඤ බමුණා
(ii) ලෙඩෙක් , මහල්ලෙක් , මළ සිරුරක් , පැවිදි රුවක්
(iii) මනස සංවර කරගැනීම මැනවි
(iv) කොළ හා තැඹිලි
(v) කය හා වචනය යන දෙකෙහි සංවර භාවය
(vi) මංගල , සුමන , රේවත , සෝභිත යන බුදුහාමුදුරුවරුන්ගෙන් දෙදෙනකු
(vii) බොරු කීම , කේලාම් කීම , පරුෂ වචන කීම ,හිස් වචන කීම යන ඒවායින් දෙකක්
(viii) සිරුරට අධික දුක්දීම හා අධික සැප දීම
(ix) කීකරුකම , අවවාද පිළිගැනීම , ඇත්ත කතා කිරීම , හරි වැරදි සඳහා ක්‍රියා කිරීම , අනතිමානී බව යන ආදී කරුණුවලින් දෙකක්
(x) බොරු බස් කීම අනුමත නොම　කරන්නෙමි
සැබෑවක් වුවද නිසි තැනකම　කියන්නෙමි　(ලකුණු 2 x 10 = 20)

02 (i) (අ) නොකළ යුතු දේ නොකිරීම　(ආ) කළ යුතු දේ කිරීම　( ලකුණු 02 යි.)
(ii) තමා වරදින් වැළකීම , අන් අය ලවා වැරදි නොකරවීම , අන්අය කරන වැරදි අනුමත නොකිරීම (ල. 03)
(iii) 1. පර පණ නැසීම.　2. සොරකම් කිරීම.　3. කාමයෙහි වරදවා හැසිරීම
4. බොරු කීම.　5. සුරා පානය　(ල. 05)

03 (i) මෙත්තා , කරුණා , මුදිතා , උපේක්ෂා　(ල. 1/2 බැගින් 02 යි)
(ii) මගෙ අම්මා මට හිත කැමතියි - මගෙ අම්මා මට සැප කැමතියි
ඈ මගෙ වැඩි දියුණුවම පතයි - සිහිනෙන්වත් අවැඩක් නොසිතයි　(ල. 03)
(iii) 1. දරුවන් පවින් වැළැක් වීම.　2. යහපතෙහි යෙදවීම
3. ශිල්ප ඉගැන්වීම　4. සුදුසු වයසේදී ආවාහ විවාහ කර දීම.
5. සුදුසු කල දායාද පවරා දීම　(ල. 05)

04 (i) ලෙඩවීම , මහළුවීම , මරණය යන දෙකක්　(ල. 02)
(ii) ප්‍රාණීන් මැරීමෙන් වැළකීම , සොරකම් කිරීමෙන් වැළකීම , කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම.　(ල. 03)
(iii) මහත් වූ භෝග සම්පත් ලැබීම , කීර්ති පැතිරීම , පිරිස් මැද නොබියව කටයුතු කිරීමට හැකිවීම , මරණයට බිය නොමැති වීම, මරණින් මතු සුගතියේ ඉපදීම.　(ල. 05)

05 (i) අනිත්‍යතාව　(ල. 02)
(ii) ළදරු , ළමා , තරුණ , මහළු වැනි ඕනෑම තුනක්　(ල. 03)
(iii) වෙනස් වීම් පෙන්වන ඕනෑම සිද්ධීන් පහක්
උදා :- මල් පොහොට්ටුව මලක් වීම ,
මල පරවීම , පැලය ගසක්වීම , කුඩා දරුවා තරුණයකු වීම , ආදී වශයෙන්　(ල. 05)

06 (i) (අ) තමන්ට හා අනුන්ට වැඩදායක වන ක්‍රියාවක්
(ආ) තමන්ට හා අනුන්ට අවැඩදායක ක්‍රියාවක්　(ල. 02)

(ii) (අ) රජුන්ට ගෙන ගිය මල් බුදුන් වහන්සේට පූජා කිරීම.
(ආ) මල් වියනක් සේ බුදුන් වහන්සේ වටේ තැන්පත් වීම.
(ඇ) ප්‍රශංසා හා තෑගි බෝග　(ල. 03)
(iii) ඕනෑම යහපත් ක්‍රියා පහක්　(ල. 05)